# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 03 / 2015

අංක 20 වෝඩ් පෙදෙස
කොළඹ 07

2015 පෙබරවාරි මස 12 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය මණ්ඩලය සඳහා වන දීමනා ප්‍රතිශෝධනය කිරීම**

''2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන් සහ විශ්‍රාමිකයින් සඳහා අන්තර් දීමනා ගෙවීම'' යන මැයෙන් නිකුත් කරන ලද 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014 ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ 2014.11.13 දිනැති කොමිෂන්සභා චක්‍රලේඛ අංක 12/2014 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව ඉහත කී කාර්ය මණ්ඩලයට දැනට ගෙවනු ලබන රු.3000/- ක මාසික අන්තර් දීමනාවට අමතරව 2015 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි තවත් රු.5000/- ක් දීමනාවක් ලෙස ගෙවීමට උපදෙස් දී ඇත. එකී කාර්ය මණ්ඩලයට ගෙවීමට යෝජිත මාසික රු.10000/- දීමනාවෙන්, ඒ අනුව ගෙවිය යුතු ඉතිරි මුදල වන රු.2000/-, 2015 ජූනි මස සිට ගෙවනු ලැබේ.

3. ඒ අනුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඉහත කී රු.5000/- හා රු.2000/- දීමනා, පිළිවෙලින් 2015 පෙබරවාරි හා 2015 ජූනි මස සිට ගෙවීමට උසස් අධ්‍යාපන ආයතන කටයුතු කළ යුතුය.

අ/කළේ, ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්

පිටපත් :
1. ලේකම්/ උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලය
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙ.ස.පුස්තකාලයාධිපතිවරුන්/ ස. පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.ලේඛකාධිකාරීවරුන්/ ස.ලේඛකාධිකාරීවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.මූල්‍යාධිකාරීවරුන්/ ස.මූල්‍යාධිකාරීවරුන්
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන ජ්‍යෙ.ස.අභ්‍ය.විගණකවරුන්/ ස.අභ්‍ය.විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති.

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/9/86

T/-